# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 සැප්තැම්බර් මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.09.21 දින නිකුත් කරන ලදී)

## නලීන් ප්‍රනාන්දු පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**නලීන් ප්‍රනාන්දු පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලීන් ප්‍රනාන්දු මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නලීන් ප්‍රනාන්දු පදනම (සංස්ථාගත කිරීමේ)**

## නලීන් ප්‍රනාන්දු පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*පූර්විකාව*

''නලීන් ප්‍රනාන්දු පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමේ සියලු කාරණා සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබූ හෙයින් ද: එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එම පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරවා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම යෝග්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2021 අංක      දරන නලීන් ප්‍රනාන්දු පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*නලීන් ප්‍රනාන්දු පදනම සංස්ථාගත කිරීම*

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) නලීන් ප්‍රනාන්දු පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කර ගනු කරනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''නලීන් ප්‍රනාන්දු පදනම'' යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිතා කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

(2) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එකී කාර්යය සඳහා සංස්ථාව ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ හා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ

(අ) ආගමික, සංස්කෘතිකමය, සමාජීය හා ආර්ථික අන්තර් ක්‍රියාකාරිත්ව තුළින් ශ්‍රී ලාංකීය ජනතාව තුළ අන්‍යෝන්‍ය අවබෝධය, සාමකාමී සහජීවනය, ආගමික සුසංයෝගය, ආධ්‍යාත්මික සංවර්ධනය සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම;

(ආ) ස්වයං රැකියාවක යෙදීමට හැකි වනු පිණිස අභියෝග්‍යතාවය සහ පෞද්ගලික කුසලතා වර්ධනය කිරීම පිණිස මූල්‍යමය සහ වෙනත් ආකාරයෙන් උදව් කිරීම ද;

(ඇ) අවශ්‍යතාවයන් ඇති ශිෂ්‍යයන්ට තම පාසල් නිල ඇඳුම්, උපකරණ සහ පොත් සපයා දීම මගින් සහාය වීම සහ ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ද්විතීයික, තෘතීයික අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ද;

(ඈ) පාසල් හැර යන තරුණ තරුණියන් සඳහා සුදුසු ව්‍යාපෘති සඳහා ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම සහ අනාගත රැකියා අවස්ථාවන් සඳහා ඇති වන තරගකාරී ඉල්ලුමට මුහුණ දීම සඳහා පුහුණු කිරීමේ අරමුණින් යුතුව එවැනි ව්‍යාපෘති පවත්වාගෙන යාම මඟින් ඔවුන්ට සහාය වීම;

(ඉ) ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටම්වල ශිෂ්‍යයන්ගේ ක්‍රීඩා, සංගීත වැනි ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම සහ අනාගත රැකියා අවස්ථාවන් සඳහා ඇති වන තරගකාරී ඉල්ලුමට මුහුණ දීම සඳහා පුහුණු කිරීමේ අරමුණින් යුතුව එවැනි ව්‍යාපෘති පවත්වාගෙන යාම මඟින් ඔවුන්ගේ සහජ හැකියාවන් වැඩි දියුණු කර ගැනීම සඳහා දිරි ගැන්වීම ද;

(ඊ) ආබාධිත පුද්ගලයින්ට ඔවුන්ගේ පෞරුෂත්වය වර්ධනය කර ගැනීමට ආධාර සහ උපකරණ සැපයීම ද;

(උ) සෞඛ්‍ය සම්පන්න, විනයකරුක, දේශානුරාගයෙන් යුත්, මානව දයාවෙන් යුත් මානව පරම්පරාවක් බිහි කිරීමට ද, දුම්කොළ, මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය වලින් තොර සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙහෙයවීම ද;

(ඌ) දුරස්ථ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් හඳුනා ගැනීම සහ එවැනි ප්‍රදේශ වල සායන සහ සෞඛ්‍ය කඳවුරු මෙහෙය වීම සහ අත්‍යවශ්‍ය අයට වෛද්‍ය ප්‍රතිකාර සැපයීම ද;

(එ) රජයේ විභාග සඳහා සූදානම් වන සිසුන් සඳහා සහාය වීමට දේශනා, සම්මන්ත්‍රණ සහ අධ්‍යාපනික චාරිකා සංවිධානය කිරීම ද;

(ඒ) නිවාස, ජලය සහ මාර්ග වැනි යටිතල පහසුකම් පිළිබඳ අඩුලුහුඩුකම් සඳහා වියදම් සොයා ගැනීමට ප්‍රදේශවාසීන්ට ස්වේච්ඡා ක්‍රියාකාරකම් වල යෙදවීම සඳහා සංවිධානය කිරීම ද;

(ඔ) මානව වර්ගයාගේ ක්‍රියාකාරකම් හේතුවෙන් සීඝ්‍රයෙන් විනාශ වී යන පරිසර පද්ධතීන් රැක ගැනීමට ප්‍රායෝගික ක්‍රියාකාරකම් සෙවීම, විනාශය අවම කර ගැනීමට ප්‍රජාව දැනුවත් කිරීම හා පරිසර හිතකාමී සමාජයක් නිර්මාණය කිරීම ද;

(ඕ) කාන්තාවන්ට නිසි තැන ලබාදීමේ අරමුණින් ඔවුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් මෙහෙය වීම, දිරියෙන් නැගී සිටීමට උත්සහ කරන කාන්තාවන්ගේ ජීවනෝපාය මාර්ග සකස් කර ගැනීමට ඇති බාධා හඳුනාගෙන ඒවාට පිළියම් සෙවීම ද;

(ක) ගර්භණී මාතාවන් සඳහා විශේෂ වෛද්‍ය සායනයන් හා දේශන මාලාවන් සංවිධානය කිරීම, කාන්තාවන් සඳහා “සුවනාරි” වැනි වැඩසටහන් පවත්වා, කලින් හඳුනාගෙන වළක්වා ගත හැකි රෝග සඳහා අවශ්‍ය වෛද්‍ය උපදෙස් සඳහා යොමු කිරීම ද;

(ග) කුඩා දරුවන්ගේ සහ විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ සෞඛ්‍ය, අධ්‍යාපන හා පෝෂණ තත්ත්වයන් නඟා සිටුවීම ද;

(ජ) ග්‍රාමීය මට්ටමින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් වල ගුණාත්මකභාවය සහ යටිතල පහසුකම් නැංවීමත්, එම දරුවන්ගේ පෝෂණ මට්ටම හා යහගුණ වර්ධනය ඇති කිරීමට කටයුතු කිරීම ද; සහ

(ට) ශ්‍රී ලංකාව තුළ ජාතික සමගිය සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සියලුම ජන කොට්ඨාස ඒකරාශී කිරීම ද වේ.

මධ්‍යම රජයේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමඟ ගැටුම් ඇති නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව

**4.** සංස්ථාව විසින් සිය පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එම පරමාර්ථ රජයේ හෝ යම් පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් ඊට සමගාමීව කරගෙන යනු ලබන ක්‍රියාවක් සමග ගැටුම් සහගත තත්ත්වයන් ඇති නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) සංස්ථාවේ කටයුතු, මෙම පනතේ විධිවිධානවලට සහ මෙම පනතේ වන වගන්තිය යටතේ සාදන ලද රීති වලට අනුකූලව සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, උප ලේකම්, පැවිදි අනුශාසක, ගිහි අනුශාසක සහ කාරක සභිකයින් 10 කට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වූ (මෙහි මින්මතු “කමිටුව” යනුවෙන් හඳුන්වනු ලබන) කළමනාකරණ කමිටුවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) කමිටුවේ ප්‍රාරම්භක සාමාජිකයා වන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලීන් ප්‍රනාන්දු මහතා කමිටුවේ ප්‍රථම සභාපතිවරයා විය යුතු ය.

(3) (අ) සංස්ථාවේ ප්‍රථම කමිටුව, මෙම පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ පදනමේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, එම කමිටුවේ සාමාජිකයින් මෙම පනතේ රීතිවලට අනුකූලව නව කමිටුවක් පත් කරන තුරු ධුර දැරිය යුත්තේ ය;

(ආ) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට වසරක කාලයක් ඇතුළත සංස්ථාවේ ප්‍රථම කමිටුව පත් කිරීම හෝ තෝරා ගැනීම කළ යුතු වේ.

(4) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුළුව කමිටුවේ සෑම නිලධරයකුම වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලැබීම හෝ තෝරා ගැනීම කළ යුතු අතර, එම වසර තුනක කාලය අවසන් වීමෙන් පසුව එම නිලධාරියා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කිරීමට හෝ තෝරා පත්කර ගැනීමට සුදුසු වන්නේ ය;

(ආ) මිය යෑම, ඉල්ලා අස්වීම, අශක්නුතාවයකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා යම් නිලධරයකුගේ ධුරය පුරප්පාඩු වන අවස්ථාවක දී කමිටුව විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම දක්වා වූ ඉතිරි කාල සීමාව සඳහා පත් කර ගැනීමේ බලය කාරක සභාවට හිමි වේ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීමට, බදුදීමට හෝ කුලියට දීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ තත්කාර්ය සඳහා නීත්‍යනුකූලව අත්කර ගැනීමට ද, සංස්ථාවේ අරමුණ ඇති අවස්ථානුකූල යයි පෙනී යන විට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හෝ බැහැර කිරීමට ද;

(ඉ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන ආකාරයෙන් සේවකයන් පත් කිරීමට, සේවයේ යෙදවීමට සහ ඔවුන් සේවයෙන් පහ කිරීමට ද;

(ඊ) සමාන අරමුණු ඇති දේශීය සහ විදේශීය ආයතන සමග සබඳතා ඇති කර ගැනීම සහ සම්බන්ධීකරණය කිරීමට ද; සහ

(උ) සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා සහ දේ කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ද සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් එකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:-

(අ) නිලතල දරන්නන් සහ ඔවුන්ගේ ධුර කාලය, සේවයෙන් අස්වීම, ඉවත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල හා කාර්ය;

(ආ) නිලතල දරන්නන් හැර, කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ ඔවුන්ගේ ධුර කාලය සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය;

(ඇ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්කර ගැනීම, නෙරපීම සහ සාමාජිකත්ව ගාස්තු;

(ඈ) සංස්ථාවේ දේපළ, පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, එහි අරමුදල් වල භාරකාරත්වය, ගිණුම් පවත්වාගෙන යාම හා විගණනය;

(ඉ) කමිටුවේ යම් රැස්වීමක දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, එහි ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයට ම සහ එවැනිම වූ රැස්වීමක දී, සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම්, ආධාර මුදල් හෝ ප්‍රදාන වශයෙන් මින් පෙර හෝ මින්මතු දේශීය හෝ විදේශීය වශයෙන් ලැබෙන සියලු මුදල් සංස්ථාවේ අරමුදල වෙනුවෙන් කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය

**8.** (1) සංස්ථාව විසින් එහි සියලු ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම්, සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් කමිටුව විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් සේවයේ යෙදවීමට, ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්, හෝ

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**9.** (1) කමිටුව විසින් විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශනය ද සමඟ එක් එක් මුදල් වර්ෂය සඳහා සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කර, එම වාර්තාව හා ගිණුම් ප්‍රකාශය සමාජ සේවා කටයුතු විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධානය (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනතේ සඳහන් රෙජිස්ට්‍රාර්වරයා වෙත එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ මාස හයක කාලයක් ඉකුත්වීමට පෙරාතුව භාරදෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට සංස්ථාව විසින් ලබාගත් විදේශීය සහ දේශීය මුදල්වලට අදාළ වෙනම ගිණුම් වාර්තාවක් අමුණා තිබිය යුතු වේ.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරීම

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු වන යම් චංචල සහ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහිලා බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ විධිවිධාන සහ සංස්ථාවේ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අය විය යුතු ණය

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මින් පිහිටුවනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලු ණය සහ පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

**12.** සභාපති සහ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, සංස්ථාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතිබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින් ඔවුන් පැමිණි සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**13.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ යම් සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**14.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.